## ලිට්රෝ Laugfs **එකම සැපයුම් ජාලයක් මඟින් LPG මිලදී ගැනීම සම්බන්ධව**

**පසුබිම**

ශ්‍රී ලංකාවේ LPG වෙළඳපොළ ආයතන 2ක් මඟින් පාලනයක් වේ. ඒ අනුව 75% ක වෙළඳපොළ කොටසක් සතු රජයට අයත් ලිට්රෝ ගෑස් ලංකා ලිමිටඩ් සමාගම සහ 25% ක වෙළඳපොළ කොටසක් හිමි Laugfs PLC එම ක්ෂේත්‍රය පාලනය කරනු ලබයි .

ලිට්රෝ ගෑස් සමාගමේ පර්යන්තය කෙරවලපිටියේ (රටේ ඉල්ලුමෙන් 60% ක් බස්නාහිර පළාතෙන් නිසා) පිහිටා තිබෙන අතර අතර Laugfs පර්යන්ත හම්බන්තොට වරායේ පිහිටා තිබේ .

LPG සඳහා සිල්ලර මිල ගණන් නියාමනය කරනු ලබන්නේ පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය විසින්ය . ඒ සඳහා මිල සූත්‍රයක් ඇති නමුත් එය 2019 ඔක්තෝබර් මස සිට ක්‍රියාත්මක වී නොමැත .

එහි ප්‍රතිපලයක් ලෙස LPG ක්ෂේත්‍රයේ වර්තමාන ගැටලු පවතින අතර ආයතන 2කම පවත්වාගෙන යනු ලබනුයේ විශාල වශයෙන් පාඩු ලබමින්ය. මීට අමතරව ලිට්රෝ සහ Laugfs LPG මිල ගනන් වල වෙනසක් පවතින අතර LPG ආනයනය කිරීම Laugfs නතර කල නිසා රට තුළ LPG හිඟයක්ද දක්නට ලැබිණ.

කෙසේ වෙතත් දැනට රජයට අයත් ලිට්රෝ ගෑස් සමාගම තම LPG ගබඩා කිරීමේ හැකියාව සහ ශක්තීන් මුල් කරගෙන වෙළඳපොළ අත්පත් කර ගෙන තිබේ.

පිරිවැය අවම කිරීමට විකල්පයක් වශයෙන් SIYOLIT (PVT) LTD නමින් සමාගමක් ස්ථාපිත කර ඒ හරහා මෙරට වෙළඳපොලේ අවශ්‍යතාවය සඳහා LPG මිලදී ගැනීමට යෝජනා කර ඇත .

මෙය පලමුව මාස හයක කාලයක් සඳහා යෝජනා කර තිබෙන නමුත් මෙලෙස සමාගමක් ස්ථාපිත කර තිබෙන බැවින් එය ස්ථිරව පවත්වාගෙන යා හැකිබව අපි විශ්වාස කරන්නෙමු . මේ නිසා වෙළඳපොළ ප්‍රමුඛයා ලෙස ශක්තිමත් පදනමකින් යුත් රජය සතු ලිට්රෝ සමාගමට තම සැපයුම සඳහා Laugfs (තරඟකරුවා) මත යැපීමට සිදුවේ. මෙමඟින් වෙළඳපොළ ඒකාධිකාරයක් වක්‍රව නිර්මාණය වෙන අතර සමාගමේ ස්වාධීනව කටයුතු කිරීමේ අයිතිය මෙන්ම මූලික අයිතිවාසිකම් පැහැර හැරීමක්ද සිදුවිය හැකිය .

මෙම තත්ත්වය ක්ෂේත්‍රය තුල වසර 150 කට වැඩි වූ අයිතිහාසික උරුමයක් පවතින ලිට්රෝ ගෑස් ලංකා සමාගමේ අයිතින් සඳහා බලපාන අතර ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවට සහ මහජනතාවට අයත් වන ලිට්රෝ සමාගම ශ්‍රී ලංකාවේ ජාතික වත්කමක් ලෙස ආරක්ෂා කළ යුතුවේ.

- සැලසුම් කිරීම සඳහා අවදානම
- මූල්‍ය අවදානම
- ක්‍රමානුකූල සැපයුම් දාමයේ අවදානම
- කොටස් හිමියන්ගේ ආයෝජනය සඳහා අවදානම

### ක්‍රියාත්මක වන ආකාරය

නව යෝජනාවට අනුව ලිට්රෝ සහ Laugfs තම සැපයම් ක්‍රමවේදයන්ගෙන් ඉවත්වී SIYOLIT සමාගම හරහා ඒකාබද්ධව මිලදී ගැනීම සිදු කල යුතුවේ. SIYOLIT සමාගම ආනයන මිල තීරණය කරන අතර LPG මෙට්රික් ටොන් 25,000 සිට මෙට්රික් ටොන් 30,000 දක්වා ප්‍රමාණයක් ආනයනය කරන එය Laugfs සතු හම්බන්තොට පර්යන්තයේ ගබඩා කරනු ලැබේ .

හම්බන්තොට පිහිටි Laugfs පර්යන්තයේ සිට කෙරවලපිටියේ පිහිටි ලිට්රෝ පර්යන්තය දක්වා LPG ප්‍රවාහනය කිරීමට Laugfs සතු නැව් භාවිතා කරනු ඇත .

## සැලසුම් කිරීම සඳහා අවදානම

- 2010 වසරේදි ශ්‍රී ලංකා රජය ලිට්රෝ ගෑස් ලංකා සමාගම ස්ථාපිත කර ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ හිමිකාරත්වය හරහා ෂෙල් ගෑස් ලංකා සමාගම සතු කොටස් රාජකීය ෂෙල් සමාගමෙන් මිලදි ගෙන ශ්‍රී ලංකාවේ LPG ක්ෂේත්‍රය තුල ශක්තිමත් ලෙස ගොඩනගන ලදි. එම අවස්ථාවේ ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව විසින් ෂෙල් සමාගමට අයිතිව තිබුණු කෙරවලපිටියේ පිහිටි LPG ගබඩා පර්යන්තය මිලදී ගෙන ඇත.
- ලිට්රෝ ගෑස් සමාගම 80% වෙළඳපොළ කොටසක් ලබා ගනිමින් බහුජාතික උරුමය සෑබෑ ශ්‍රී ලාංකික සමාගමක් බවට පරිවර්තනය කරමින් 2010 වසරේ සිට රාජ්‍ය ආදායමට විශාල දායකත්වයක් ලබා දෙමින් ක්‍රියාත්මක වෙයි.
- වෙළඳපොලේ පවතින මෙම ආධිපත්‍යය සමාගමට පමනක්ම නොව ශ්‍රී ලංකාවේ මහජනතාවට LPG අත්‍යවශ්‍ය බලශක්ති ප්‍රභවයක් බව සැලකිල්ලට ගනිමින් එය පවත්වා ගැනීම වඩා වැදගත්වේ.
- රජයට අයත් සමාගමක් මඟින් LPG ක්ෂේත්‍රය තුල ආයෝජනය කරමින් ශක්තිමත් ලෙස පවත්වාගෙන යෑමේ ක්‍රියාවලිය මෙම නව යෝජනාව මඟින් නිශ්ඵල කර ඇත .

- රට තුල ස්වාධීන සැපයුම් ආයතන 2ක් පැවතුන නමුත් මෙම යෝජනාව යටතේ එය එක් සැපයුම් ආයතනක් මඟින් පමනක් සිදුකිරීම කිරීමට බලාපොරොත්තු වනු ඇත .
- දැනට ස්වාධීන ආනයනය මෙහෙයුම් ජාල 4ක් හරහා සිදු කරනු ලැබේ.

  1 කොළඹ පිහිටි ලිට්රෝ පර්යන්තය. (ලිට්රෝ සමාගම සඳහා කොළඹ වරායේ විකල්පයක් ඇත)

  2 හම්බන්තොට පිහිටි ලිට්රෝ ගෑස් පර්යන්තය.

  3 හම්බන්තොට පිහිටි Laugfs පර්යන්තය.

  4 කොළඹ වරායේ Laugfs මෙහෙයුම.

මෙය හම්බන්තොට පිහිටි Laugfs පර්යන්තය හරහා එක සැපයුම් ජාලයක් දක්වා අඩු කිරීමට යෝජනා කර තිබේ .

- සියලුම නිෂ්පාදන ලිට්රෝ ගෑස් පාලනයෙන් තොරව හම්බන්තොට Laugfs පර්යන්තයේ සිට කොළඹ දක්වා ප්‍රවාහනය කරනු ලැබේ.
- හම්බන්තොට වරායේ LPG ගොඩබාන ක්‍රමවේද 3 ක් තිබෙන අතර මෙයින් 2ක් ලිට්රෝ පර්යන්තයට සහ 1 ක් Laugfs පර්යන්තයට සම්බන්ධව ඇත.
- මේ වන විට ලිට්රෝ පර්යන්තයේ නල පද්ධතිය සම්බන්ධ ගැටලුවක් පවතින අතර එය වසරකට වැඩි කාලයක් ක්‍රියා විරහිතව පවතියි. Laugfs සඳහාද ඒ හා සමාන ගැටලුවක් සිදුවුවහොත් එය මුළු රටේම සැපයුම කෙරෙහි දැඩි අවදානමක් ඇති කරනු ඇත .
- එක් සැපයුම්කරුවෙක් මත යැපීමේදී හෝ හම්බන්තොට පර්යන්තයේ නල මාර්ගයක හෝ සැපයුම් ක්‍රමවේදවල ගැටළුවක් ඇතිවුවහොත් එය වෙළඳපොළ සැපයුම කෙරෙහි විශාල බලපෑමක් ඇති කරනු ඇත .
- පාරිභෝගිකයින්හට ලබාදෙන සුවිශේෂි වටිනාකම , වෙළඳ නාම වටිනාකම සහ වෙළෙඳපොළ කොටස අහිමි වීමේ අවදානමක් ඇතිවිය හැකිය.

1. වර්තමාන මිල ගනන් වලට අනුව වෙළඳපොළ සෑම 1%ක කොටසකින් නියෝජනය වනුයේ ලිට්රෝ සමාගමේ ආදායමෙන් මිලියන 600කි.

2. පසුගිය වසර 150 තුළ ගොඩනගන ලද සමාගමේ වෙළඳ නාමය එම සමාගමේ වඩාත්ම වටිනා වත්කම ලෙස සැලකිය හැකිය. තරඟකරු තම වත්කම් (වෙළඳ නාම, පර්යන්ත සහ නැව්) උපයෝගිකර නිෂ්පාදන සපයන අතර ලිට්රෝ සැපයුම Laugfs හරහා වෙළඳපොළට පැමිණෙන බැවින් පාරිභෝගිකයින්හට ලබා දෙන සුවිශේෂී වටිනාකම අහිමි වනු ඇත.

3 දැනට මිල පිළිබඳ ගැටලු පැවතුනද ලිට්රෝ වෙළඳපොළ තුල නොකඩවා සැපයුම පවත්වා ගෙන ගිය අතර තරඟකරු LPG සැපයුම නතර කළේය. මෙලෙස Laugfs සිය මෙහෙයුම් නැවත නැවැත්වුවහොත් මුළු දිවයිනේම LPG සැපයුම අවදානමට ලක් වන අතර බැවින් සහ පර්යන්ත වත්කම් අප සතු නොවීම හෝ ක්‍රියාත්මක කිරීම පිළිබඳව අයිතියක් නොමැති නිසා ඒ සඳහා අපට වෙනත් විකල්පයක් නොමැතිවීම.

4 LPG ක්ෂේත්‍රයේ ඕනෑම බිඳවැටීමක් හෝ හිඟයක් ලිට්රෝ සන්නාමය කෙරෙහි අහිතකර ලෙස බලපාන අතර එය කොටස් හිමියන්ට, රජයට සහ පාරිභෝගිකයින්ටද දැඩි බලපෑමක් ඇති කරයි.

**මූල්‍ය අවදානම**

- ලිට්රෝ ගෑස් සමාගමේ පර්යන්තය LPG සඳහා වැඩිම ඉල්ලුම පවතින බස්නාහිර පළාතේ පිහිටුවා ඇත. සමාගමේ වර්තමාන සැපයුම් කළමනාකරණය මඟින් තොග ගබඩා කිරීමේ වියදම අවම වන අතර එය සමාගමට ඉතිරියක්වේ.
- යෝජිත සැලැස්මට අනුව ගබඩා කිරීම සඳහා සඳහා විශාල පිරිවැයක් දැරීමට සිදුවන අතර එය වර්තමාන මූල්‍ය සහ ගබඩා පිරිවැයට වඩා වැඩිවේ.

මෙම නව යෝජනාව මඟින් ස්වාධීන ටෙන්ඩර් කිරීම ඉවත් වන අතර සැපයුම සඳහා ඒකාධිකාරයක් නිර්මාණය වීමට ඉඩ ඇත . මේ නිසා පහත සඳහන් බලපෑම්ද ඇතිවිය හැකිය.

- o ආයෝජකයින්ගේ විශ්වාසය දේශීය හා විදේශීය වශයෙන් බිඳවැටීම.
- o විනිවිදභාවය පිළිබඳ ගැටළු ඇතිවිම .
- o ඒකක ප්‍රමාණය අනුව වටිනා මිලකට නිෂ්පාදන ලබා ගැනීමට ලිට්රෝ සතු අයිතිය අහිමිවීම.

- LPG සැපයුම Laugfs විසින් සිදු කරන බැවින් ඔවුන් තම වගකීම් සහ බැඳීම් ඉටුකිරීම යම් ආකාරයකින් පැහැරියහොත් නිසා සිදුවන ඕනෑම මූල්‍යමය, නීතිමය හෝ මෙහෙයුම් ගැටළුවක් ලිට්රෝ සමාගම කෙරෙහි සෘජුවම බලපානු ඇත .
- මෙම යෝජිත සැලැස්ම ලිට්රෝ සමාගම දිවයින පුරා යටිතල පහසුකම් සංවර්ධනය සඳහා කරනු ලබන ආයෝජන කෙරෙහිද බලපෑම් ඇති කරනු ඇත . තවද මෙමඟින් දිගු කාලීනව තරඟකරුවා ශක්තිමත් වන අතර ලිට්රෝ ගෑස් සමාගම දුර්වල වනු ඇත .
- LPG මිලදී ගැනීම සඳහා SIYOLIT සමාගම පිහිටුවීම සහ එම සමාගමෙන් LPG මිලදී ගැනීම සඳහා ගිවිසුම්ගත වීම Laugfs සමාගමේ යෝජනාවකට අනුව බව පැහැදිලිවම දැකිය හැකි කරුනකි. මෙම යෝජනාවේ සඳහන් දත්ත සැක සහිත වන අතර Laugfs කෙරෙහි පක්ෂපාතී බවක් දැකිය හැකිය . උදාහරණයක් ලෙස Laugfs පර්යන්ත මිල ඇ.ඩො. 13.5 ක් සහ ලිට්රෝ සමාගම සඳහා එය ඇ.ඩො.6 ක් ලෙස සඳහන් කර ඇත . මෙහිදී විශාල පර්යන්තයකට සැපයීමේදී පිරිවැය අඩු විය යුතු බව පෙන්වාදිය යුතුය. මේ සඳහා නිවැරදි තීරණයක් ගැනීමට නම් ස්වාධීන පාර්ශවයක් මඟින් නිවැරදි දත්තයන් සමාගම් දෙකෙන්ම ලබා ගැනීම වැදගත්වේ.

සමාගම් 2ටම ප්‍රතිලාභ ලැබිය හැකි වුවද (ලිට්රෝ සඳහා එය කෙටිකාලීන විය හැකිය.) ලිට්රෝ සමාගමට වැඩි ඉල්ලුමක් පවතින නිසා Laugfs මෙමඟින් වැඩි වශයෙන් ප්‍රතිලාභ ලැබිය හැකිය. එමෙන්ම මිල ගනන් එක හා සමාන වුවද අපගේ ශක්තිය සහ තරඟකාරී වාසිය අපහට නැතිවිය හැකිය. සම්පූර්න ආර්ථික වාසිය පාරිභෝගිකයාට ලබාදිය යුතු අතර එය තරඟකරුවාට ලබා නොදිය යුතුබව අපි විශ්වාස කරන්නෙමු. එබැවින් පිරිවැය තිරණය කිරීම කිරීම පිළිබඳව මෙම යෝජනාවට ඇතුලත් කල යුතුය.

## ක්‍රමානුකූල සහ සැපයුමට ඇති අවදානම

- **ස්වාධීන ලන්සු තැබීම** - CIF මත කෙලවරපිටිය පදනම් කර සමාගම විසින් මිල නියම කිරීම මඟින් ආයතනයට ලබාගත හැකි දිගුකාලීන වාසිය මෙම මෙම ක්‍රමවේදය තුලින් සදහටම අහිමි වනු ඇත.

ලිට්රෝ සමාගම විසින් ඩොලර් CP +48 CIF කෙරවලපිටිය මිල ලෙස මෑත කාලයේදී කොන්ත්‍රාත් පදනමට ලබාගෙන තිබෙන බව මේ අවස්ථාවේ මතක තබාගත යුතුය. නමුත් නව යෝජනාව තුලින් මෙම මිල ගනන් CIF හෝ CP හම්බන්තොට වෙනුවෙන් ලබා ගත නොහැකිය. සැපයුම් සඳහා මේ වනවිට ලිට්රෝ සමාගමට CP+33 මිලටද යෝජනා ලැබී ඇත. ස්වාධීන ලන්සු තැබීම නතර කිරීම අහිතකර වන අතර එමගින් දිගුකාලීන මිල ගනන් වැඩිවීමක්ද සිදුවිය හැක.

- මෙම යෝජනාව මඟින් ලිට්රෝ සමාගමට ඉවත්වීම පිලිබඳ වගන්ති පැහැදිලිව අර්ථ දක්වා නොමැති නම් ගැටළු පැන නඟින අවස්ථාවකදි රජය සතු ලිට්රෝ සමාගමට ඉවත්වීමට බාධා ඇතිවිය හැකිය.
- සැපයුම එකම ආයතනයක් මඟින් ක්‍රියාත්මක වන නිසා සිදුවන අවදානම -

මුළු රටම තනි සැපයුම්කරුවෙක් සහ එක ජාලයක් මත රඳා පවතින බැවින් එය සමස්ත LPG ක්ෂේත්‍රයේම අවදානම් තත්ත්වයක් ඇති විය හැකිය. ඊට අමතරව එමඟින් පහත සඳහන් තත්ත්වයන්ද ඇතිවිය හැකිය.

  - ගුණාත්මකභාවයෙන් තොර අපද්‍රව්‍ය මිශ්‍ර කල නිෂ්පාදන වෙළඳපොළට පැමිණීම.
  - ගැටුම්කාරී තත්වයන් සැපයුම්කරු විසින් පැහැර හැරිම.
  - මෙවැනි අවස්ථාවන්හිදි එය යථාතත්ත්වයට පැමිණීමට සති කිහිපයක් ගතවන බැවින් LPG මත යැපෙන කර්මාන්ත සහ වානිජ අංශවල ව්‍යාපාර මෙන්ම අපනයනය ආශ්‍රිත ව්‍යාපාර කෙරෙහි දැඩි බලපෑමක් ඇතිවිය හැකිය.
- යෝජිත ව්‍යාපාර සැලැස්මට අනුව සැපයුම් ජාලයට නව අතරමැදියෙකු ඇතුළු වෙන නිසා ලිට්රෝ පාරිභෝගිකයින්ට දෙවරක් ගෙවීමටද සිදුවනු ඇත .
- නිෂ්පාදන වියදම ඉහළ යාම සහ විනිමය අනුපාතයේ සිදුවන මිල අඩුවැඩිවීම ලිහිල් කිරීමට මෙම යෝජිත සැලැස්මට නොහැකි බැවින් ගෘහස්ත වෙළඳපොළ තුල ඇතිවිය හැකි LPG මිල වැඩි කිරීම වෙනුවට මිල අඩු කිරිමක් ඇති විය හැකිය.

## කොටස්කරුවන්ගේ ආයෝජනයට අවදානම

අනාගතයේදී කොටස් හිමියන්ට ලැබෙන ප්‍රතිලාභ සමාගමේ ස්වාධීන හා තරඟකාරී පදනම මත සිදුනොවීම.

- දැනට ගෘහස්ත අළෙවිය සඳහා මිල නියාමනය ක්‍රියාත්මක් වුවත් මිලදී ගැනීම ස්ථාවර මිලකට අනුව සිදුවන බැවින් එය ගෘහස්ථ පමනක් නොව ව්‍යාපාර සහ කර්මාන්ත කෙරෙහිද බලපානු ඇත.
- Laugfs විසින් ලිට්රෝ හරහා ආර්ථික වාසි ලබා ගන්නා අතර මෙම වාසි ස්ථාවර ලෙස පවතිනු ඇත.
- ලිට්රෝ ගෑස් සමාගමට නිෂ්පාදනය කිරීමේ හැකියාවන් අහිමි වන බැවින් කොටස් හිමියන්ට වටිනාකමක් දීමට නොහැකිවීම.
- දිවයිනේ සමස්ත LPG සැපයුම කොටස් වෙළඳපොලේ ලැයිස්තුගත සමාගමක දැඩි පාලනයකට නතුවීම තුල ලිට්රෝ සමාගමේ ප්‍රධාන කොටස් හිමියන්ට, රජයට සහ මහජනතාවට අගතියක් සිදුවීම .